# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/ 30/2020 (PSC)

1. එන්.ඩී.එස්.පී.කුමාර

අභියාචක

එදිරිව

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වගඋත්තරකරු

**දිනය :-2025.03.25**

**ඉදිරියේ දී :-** විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)

ජේ.ජේ.රත්නසිරි (සාමාජික)

එස්.නන්දසේකරන් (සාමාජික)

**පෙනී සිටීම :-** එස්.ඩී.එස්.පී.කුමාර අභියාචක සිටී,

අභියාචක වෙනුවෙන් රැකවරණ නිලධාරී, එස්.පී.විතානගේ මහතා,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම්, කසුන් සෙනවිරත්න මහතා,

**ජේ.ජේ.රත්නසිරි මහතා - (සාමාජික) පරි. අභි.විනි. අධිකාරය**

**-<u>නියෝගය</u>-**

අභියාචක එන්.ඩී.එස්.පී.කුමාර, හිටපු දුම්රිය ස්ථානාධිපති III කළුතර දකුණ, ඔහුගේ අංක AAT/30/2020(PSC) හා **2019.11.23** දින දරණ අභියාචනය මගින් දන්වා සිටින්නේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ විනය බලධාරියා දී ඇති විනය නියෝග දෙකම අහෝසි කරන ලෙසය.

අභියාචක ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ, දුම්රිය ස්ථානාධිපතිවරයෙකු ලෙස කළුතර දකුණ දුම්රිය ස්ථානයට අනුයුක්තව සේවය කරමින් සිටිය දී, 2016.11.05 දින සිදුවු රාජකාරි අතපසු කිරීමක් පිළිබඳව දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් ඔහුගේ අංක වි 2598/01/2016(කො) හා 2017.09.23 දින දරණ චෝදනා පත්‍රය ලබා දී ඇත. අදාළ චෝදනා පත්‍රයට අනුව චෝදනා 05ක් ගොනු කර ඇත.

i. ඔබ 2016.11.05 දින පැය 01.00 හෝ ආසන්න වේලාවක දී දකුණු කළුතර දුම්රිය ස්ථානයේ දුම්රිය ස්ථාන මෙහෙයුම් රාජකාරියෙහි නියුක්තව සිටියදී රාජකාරි කාලය තුළ තම සේවා ස්ථානයේ නිදා ගැනීම සිදු කිරීමෙන් දු.ආ.නි.9(ඉ) යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කළෙහිය.

ii. ඔබ 2016.11.05 දින ඉහත චෝදනාව පරිදි රාජකාරිය පිළිබඳ අනවධානයෙන් හා නොසැලකිලිමත්ව කටයුතු කිරීමෙන් අංක 8307 දුම්රිය විනාඩි 07ක් හෝ ආසන්න කාලයක්, අංක 8776 දරණ දුම්රිය විනාඩි 05ක් හෝ ආසන්න කාලයක් ප්‍රමාද කිරීමෙන් දු.ආ.නි.9(ඇ) යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කළෙහිය.

iii. ඔබ 2016.11.05 දින ඔබ ඉහත පළමු හෝ දෙවන චෝදනාව පරිදි කටයුතු කර දකුණු කළුතර දුම්රිය ස්ථානයේ තමා

වෙත නිල වශයෙන් පවරා තිබූ මෙහෙයුම් රාජකාරී නිසි පරිදි ඉටු නොකිරීමෙන් දූ.ආ.නි.9(ඉ) යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කලෙහිය.

iv. ඔබ ඉහත පළමු හෝ දෙවන හෝ තෙවන චෝදනාව/චෝදනා පරිදි කටයුතු කර දකුණු කළුතර දුම්රිය ස්ථානයේ අනෙකුත් සේවකයින්ට නරක ආදර්ශයක් ලබා දීමෙන් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කලෙහිය.

v. ඔබ ඉහත චෝදනා එකකට හෝ සියල්ලටම අනුව කටයුතු කිරීමෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ විනය පරිහානියට පත් කලෙහිය.

මෙම චෝදනා පත්‍රයට අමුණා ලිපි ලේඛන හා ප්‍රකාශ 19ක් ඉදිරිපත් කර ඇත. අදාළ චෝදනා පත්‍රයට පිළිතුරු ලෙස අභියාචක 2017.10.19 දින පිළිතුරු සපයා ඇති අතර, ඒ පිළිබඳව සෑහීමට පත් නොවන දුම්රිය සාමාන්‍යාධිකාරී, ඔහුගේ අංක වි 2598/01/2016(කො) හා 2018.02.21 දින දරණ ලිපිය මඟින් විනය නියෝගයක් ලබා දී ඇත.

ඒ අනුව අදාළ වැරදි වලට වැරදිකරු කරමින්,

i. දින 07ක වැටුප් දඩයක්

ii. තදින් තරවටු කිරීම

දඩුවම් ලබා දී ඇත.

අභියාචක ඔහුගේ 2018.03.26 දින දරණ ලිපිය මගින් දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත දක්වා ඇත්තේ මෙම විනය නියෝගයේ සඳහන් දඩුවම් වලට වැඩි මනත් ලෙස ග.අ.ගේ අංක DB 24418/13/2016 හා 2016.12.02 දින දරණ ලිපිය මගින් සිදුකර තිබූ වැඩ තහනම හා මරදාන දුම්රිය ස්ථානයට ලබා දී තිබූ ස්ථාන මාරුව එහි සඳහන් නොවන බවයි. ඒ අනුව දින 07 වැටුප හැර ඉතිරි දින සඳහා වැටුප් ලබාදෙන ලෙස හා මරදාන දුම්රිය ස්ථානයට ලබා දී ඇති ස්ථාන මාරුව අවලංගු කරන ලෙසට ඉල්ලා ඇත.

එම ඉල්ලීමට ප්‍රතිචාර ලෙස දුම්රිය සාමාන්‍යාධිකාරී ඔහුගේ වි 2598/01/2016(කො) හා 2018.08.06 දින දරණ විනය නියෝගය සංශෝධනය කර ඉදිරිපත් කර ඇත. ඒ අනුව

i. දින 07 ක වැටුප් දඩ ගැසීම

ii. තදින් තරවටු කිරීම,

iii. වැඩ තහනම් කාලය වැටුප් රහිත ලෙස සැලකීම,

iv. මරදාන දුම්රිය ස්ථානයට ස්ථාන මාරුව වසර 02 බල පැවැත්වීම.

එම නියෝගයට අනුව අභියාචක 2018.10.22 දින රාජ්‍ය සේවා කොමිෂමට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම අභියාචනය පිළිබඳව අධ්‍යයනය කළ රාජ්‍ය සේවා කොමිෂම ඔවුන්ගේ 2019.10.29 දින ලිපිය මඟින් අභියාචකට සහනයක් සළසා දෙමින් අදාළ වැඩ තහනම් කාලයට අඩ වැටුප් ගෙවීමට යටත්ව සහනයන් සළසා දී ඇත. අනිකුත් දඬුවම් එලෙසට ක්‍රියාත්මක වීමට දක්වා ඇත.

අභියාචක මෙම තීරණ දෙකටම එරෙහිව මෙම අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කරමින් ඉල්ලා සිටින්නේ, මෙම නියෝග ආයතන සංග්‍රහයට පටහැනි බැවින්, ඒවා අවලංගු කරන ලෙසය.

අභියාචක 2025.01.23 දින ලිඛිත සංදේශයක් ඉදිරිපත් කර ඇති අතර ඒ තුළින් ප්‍රකාශ කර සිටින්නේ ද මෙම ක්‍රියාවලිය තුළ ආයතන සංග්‍රහයේ පවතින විධිවිධාන පිළිබඳව අඩුපාඩු මිස, අදාළ වරද කළ බව හෝ ඊට සහනයන් ලබාදෙන ලෙස නොවේ.

මේ පිළිබඳව අදාළ විමර්ශන ගොනුව හොඳින් පරිශීලනය කිරීමේ දී පෙනී යන්නේ, මෙම අභියාචකට අමතරව එම අවස්ථාවේ ඔහු සමඟ සේවය කළ තවත් පුද්ගලයන් 05 සඳහා මෙම චෝදනාවන් යටතේ චෝදනා ගොනු කර ඇති බවත් ය. එසේම ඒ අයට ද යම් යම් දඬුවම් ලබා දී ඇත. ඒ අය කිසිවකු ඒ සඳහා අභියාචනාවන් සිදුකර නැත.

අදාළ මූලික විමර්ශන වාර්තාව අනුව අභියාචක අදාළ වරද සිදුකර ඇති බව පිළිගෙන ඇති අතර, ඒ බැව් අභියාචකයෙකුගේ ප්‍රකාශයේ "**මා අතින් රාජකාරි පැහැර හැරීමක් සිදුවුවා. එහෙත් මාගේ වසර 33 ක සේවා කාලය තුළ වරදක් හෝ චෝදනාවකට කටඋත්තරයක් හෝ දී නැත. ප්‍රථම වතාවට සිදුවූ වරද සම්බන්ධයෙන් මා හට සමාව ලබාදෙන ලෙස ඉල්ලා සිටිමි.**" ප්‍රකාශ කර ඇත.

එසේම අදාළ අතපසුවීමට හේතුව ලෙස අදාළ ප්‍රකාශයේ මෙසේ සටහන් කර ඇත.

" **දු.ස්ථා (මො) ලෙස 2016.03.10 දින සිට සේවය කරනවා. 2016.11.04 දින පෙ.ව.8.00 සිට 24.00 පැය දක්වාත් 2016.11.05 දින 0000 - 8.00 දක්වාත් වේ. මා දුස්ථා (මො) ලෙස දුම්රිය ස්ථානයේ දුස්(මො) ට අදාළ මේසයේ සිට රාජකාරි කරමින් සිටියා. මෙදින 8776 දුම්රිය ස්ථානයට පැමිණි වෙලාව මතක නැත. එම දුම්රිය පැමිණි වෙලාවේ මා හාන්සි පුටුවේ සිටියා. දැනට සති දෙකකට පමණ පෙර අනතුරකින් කකුල් දෙකේම මහපට ඇඟිලි දෙකම දරුණු ලෙස තුවාල වූවා. එම තුවාල කැක්කුම නිසා මා වෛද්‍යතුමාගේ උපදෙස් මත ප්‍රතිකාර ලබනවා. එම බෙහෙත් ගත්පසු මත් ගතියක් දැනෙනවා. එම නිසා හාන්සි පුටුවේ සිටියදී, රාත්‍රී අවසන් මගී දුම්රිය අංක 8783 දුම්රිය රාත්‍රී 1053 පිටත්ව ගිය පසු හාන්සි පුටුවට ගියා.**

**අංක 8776 බඩු දුම්රිය දිනපතා ධාවනය වන්නේ නැහැ. ධාවනය වුවත් නිශ්චිත වේලාවකට යන්නේ නැහැ.”**

මේ අනුව වෛද්‍ය හේතූන් සහ අවිවේකීව එක දිගට පැය 24 සේවය කිරීම පිළිබඳව සානුකම්පිතව සළකා බැලිය යුතුය.

ඉහත සියළු කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේ දී එකම වරදට චෝදනා පත්‍ර දෙකක් සහ විනය නියෝග 03ක් (01) **ග.අ.ගේ අංක DB 24418/13/2016 හා 2016.12.02**, (02) **දුම්රිය සාමාන්‍යාධිකාරී, වි 2598/01/2016(කො) හා 2018.02.21**, (03) **දුම්රිය සාමාන්‍යාධිකාරී වි 2598/01/2016(කො) හා 2018.08.06** ලබාදීම යුක්ති සහගත නොවන බව පෙනී යයි. අභියාචක ඉල්ලා සිටින පරිදි හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනටමත් යම් සහනයක් සළසා දී තිබෙන නිසා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇති වැඩ තහනමට ලක්ව සිටි දින 27 තුළ (දින 07ක් වැටුප් දඩ ලෙස දඩුවම් කර ඇත) දින 20ක් සඳහා අඩ වැටුප් ලබා දීම වෙනුවට ඒ දින 20 සඳහා පූර්ණ වැටුප් ලබාදීම සුදුසු බවට නියෝග කරමි.

එසේම ඉල්ලා ඇති තවත් සහනයක් වන ස්ථානමාරු නියෝගය අවලංගු කිරීම දැනටමත් වසර 02 ක දඩුවම් කාලය ඉක්මවා ඇති බැවින්, අභියාචකගේ දුෂ්කරතා හා රාජකාරී අවශ්‍යතාව අනුව ඒ පිළිබඳව පාලන අධිකාරියට තීරණයක් ගැනීමට අවකාශ පවතී.

ඉහත කොන්දේසි වලට යටත්ව අභියාචනයට ඉඩ ලබා දී ඇත.

මෙම නියෝගයේ පිටපත් අභියාචක, දුම්රිය සාමාන්‍යාධිකාරී හා ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවන්න.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-